# කෘෂිකර්ම අමාත්‍යාංශයේ විධායක නිලධාරී සේවා ගණය
# (නීති නිලධාරී) තනතුර සඳහා වන බඳවා ගැනිමේ හා උසස් කිරීමේ පටිපාටිය

**01. සම්බන්ධ වන ආයතන**

1.1 දෙපාර්තමේන්තුව : කෘෂිකර්ම අමාත්‍යාංශය
යොමු අංකය: MED/AD/E3/1/2/LO-EB දිනය: 2014.07.03

1.2 අමාත්‍යාංශය : කෘෂිකර්ම අමාත්‍යාංශය
යොමු අංකය: MED/AD/E3/1/2/LO-EB දිනය: 2014.07.03

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින්
තනතුරු අනුමත කිරීම: යොමු අංකය: DMS/C2/22 දිනය: 2013.12.24

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ
නිර්දේශය: යොමු අංකය: Est-3/RECRU/05/8041 දිනය: 2014.11.11

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ
නිර්දේශය: යොමු අංකය: NSCC/1/22/SR දිනය: 2014.09.17

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය:
යොමු අංකය: PSC/EST/4/1/22/1/2012 දිනය: 2015.05.12
සංශෝධනය
යොමු අංකය: PSC/EST/06-01-42/01/2015 දිනය: 2017.01.05

**02. පත් කිරීමේ බලධරයා පිළිබඳ විස්තර**

2.1 පත් කිරීමේ බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**03. නිලධර ගණය පිළිබඳ විස්තරය**

3.1 නිලධර ගණය : විධායක

3.2 ශ්‍රේණිය : III, II සහ I ශ්‍රේණි

3.3 පැවරෙන කාර්යභාරය පිළිබඳ පොදු නිර්වචනය :

කෘෂිකර්ම අමාත්‍යාංශය සහ එහි විෂය පථයට අයත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා කෘෂිකර්ම අමාත්‍යාංශය යටතට ගැනෙන අනෙකුත් ව්‍යවස්ථාපිත ආයතනවල නීතිමය කටයුතු සඳහා උපදෙස් දීම, පනත් කෙටුම්පත්, රෙගුලාසි වැනි නීතිමය ලියවිලි සකස් කිරීම, නීතිපති දෙපාර්තමේන්තුව හා සම්බන්ධීකරණය, මානව හිමිකම් පැමිණිලි සම්බන්ධව ක්‍රියා කිරීම සහ අමාත්‍යාංශයේ සහ එහි විෂය පථයට අයත් රාජ්‍ය ආයතනවල නිලධාරීන් රාජකාරි විෂයපථයට අදාළ කරුණක් මත වග උත්තරකරුවන් වන නඩු සම්බන්ධයෙන් උපදෙස් ලබා දීම හා නඩු සඳහා සහභාගී වීම.

3.4 කාර්යයන් පැවරීම :

ශ්‍රේණිගත කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකු දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලැබිය හැක.

**04. තනතුරෙහි/තනතුරුවල ස්වභාවය :** මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිත ය.

05. වැටුප්

5.1 වැටුප් කේත අංකය : SL- 1 -2006

5.2 වැටුප් පරිමාණය : රු. **22,935 -10 × 645 - 8 × 790 - 17 ×1050 - 53,555/-**

5.3 ශ්‍රේණියට අදාළ ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | වැටුප් පියවර | වැටුප් තලය (රු.) |
|---|---|---|
| III | පියවර 01 | රු.22,935 |
| II | පියවර 12 | රු.30,175 |
| I | පියවර 20 | රු. 36,755 |

**06. නිලධර ගණයට අයත් තනතුර / තනතුරු**

6.1 අනුමත තනතුරු නාම, තනතුර අනුමත ශ්‍රේණිය, අනුමත තනතුරු සංඛ්‍යාව, කාර්යයන් :

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| නීති නිලධාරී | III | 01 | කෘෂිකර්ම අමාත්‍යාංශය සහ එහි විෂය පථයට අයත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා කෘෂිකර්ම අමාත්‍යාංශයේ යටතට ගැනෙන අනෙකුත් ව්‍යවස්ථාපිත ආයතනවල නීතිමය කටයුතු සඳහා උපදෙස් ලබාදීම, පනත් කෙටුම්පත්, රෙගුලාසි වැනි නීතිමය ලියවිලි සකස් කිරීම, නීතිපති දෙපාර්තමේන්තුව හා සම්බන්ධීකරණය, මානව හිමිකම් පැමිණිලි සම්බන්ධව ක්‍රියාකිරීම සහ අමාත්‍යාංශයේ සහ එහි විෂය පථයට අයත් රාජ්‍ය ආයතනවල නිලධාරීන් රාජකාරී විෂය පථයට අදාළ කරුණක් මත වග උත්තරකරුවන් වන නඩු සම්බන්ධයෙන් උපදෙස් ලබාදීම හා නඩු සඳහා සහභාගී වීම. ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් කාර්යයන්. |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : 01

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා III, II හා I ශ්‍රේණීන් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

## 07 බඳවා ගැනීමේ ක්‍රමය

### 7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන්

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 100% |

### 7.2 විවෘත බඳවා ගැනීම

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය: III ශ්‍රේණිය

7.2.2 සුදුසුකම්: (බාහිර අයදුම්කරුවන්)

7.2.2.1 අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම්:

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම හා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දී තිබීම.

7.2.2.2 පළපුරුද්ද:

දිවුරුම් දීමෙන් අනතුරුව නීතිඥයකු වශයෙන් වසර 03 කට නොඅඩු සක්‍රිය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

7.2.2.3 කායික සුදුසුකම්:

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුතු විය යුතු ය.

7.2.2.4 වෙනත්:

I ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.

II අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

III තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් කරන දිනයට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

IV ඉංග්‍රීසි භාෂාව පිළිබඳ මනා දැනුමක් තිබිය යුතු අතර, අ.පො.ස (සා.පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක් ලබා හෝ වෙනත් රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබිය යුතු ය.

7.2.3 වයස:

| | | |
|---|---|---|
| 7.2.3.1 අවම සීමාව | : | අවුරුදු 21ට නොඅඩු |
| 7.2.3.2 උපරිම සීමාව | : | අවුරුදු 45 ට නොවැඩි |

සටහන - කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළ තනතුරක වසර පහ (05)කට නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා පළපුරුද්දක් හා ඉහත 7.2.2 යටතේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති රජයේ නිලධාරීන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය:

7.2.4.1 ලිඛිත විභාගය : අදාළ නොවේ.

7.2.4.2 වෘත්තීය පරීක්ෂණය: අදාළ නොවේ.

7.2.4.3ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය: